**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.4,950,000 ක් වටිනා මෝටර් වාහන 02 ක් ශේෂ පත්‍රයේ රජයේ ප්‍රදාන ලෙස වෙනම දක්වනු වෙනුවට ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් මාසය සඳහා සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු රු.1,350,250 ක් වූ දායකය සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් මාසය සඳහා ගෙවන ලද රු.72,495 ක් වූ සේවක භාරකාර අරමුදල් දායකය සේවක භාරකාර අරමුදල් ගිණුමට හර කිරීම වෙනුවට සේවක අර්ථ සාධක අරමුදල ගිණුමට හර කර තිබුණි.

(ඈ) මණ්ඩලයේ අතිරික්ත අරමුදල් ලෙස රු.මිලියන 50.337 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණද, රු. මිලියන 50 ක් පමණක් ප්‍රාග්ධන ගිණුමට හර කර ඉතිරි මුදල ආයෝජන මත පොලී ගිණමට හර කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ගිණුම රු.337,000 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර, ආයෝජන මත පොලී ගිණුම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ලංකා බැංකුවෙන් ලැබුණු සනාථ කිරීම්වලට අනුව, 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන තාවකාලික අතිරිකත භාර අරමුදලේ ශේෂය රු.301,257,161 ක් වූ අතර, ශේෂ පත්‍රයට අනුව එය රු.298,888,579 ක් විය. රු.2,368,582 ක් වූ වෙනස සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ලෙස දක්වා තිබුණද එය බැංකුවෙන් ලැබුණු පොලිය බව නිරීක්ෂණය විය.

(ඊ) රු.83,167 ක් වූ ණයහිමියන් නිරවුල් කිරීම වර්ධන බදු මත වියදම් ගිණුමට සාවද්‍ය ලෙස හර කර තිබුණි. එබැවින්, ණය හිමි ගිණුම හා වර්ධන බදු මත වියදම් ගිණුම රු.83,167 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවලට ලැබුණු රු.2,044,508 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායමට ගෙන නොතිබුණි.

### 1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු සැසඳුම් ප්‍රකාශන 05 ක දැක්වෙන මුදල් පොතේ ශේෂය හා 2011 දෙසැම්බර් 31 දිනට අදාළ මුදල් පොත්වල දැක්වෙන ශේෂ අතර රු.13,238 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) එක්සත් අරාබි එමීර් රාජ්‍යය (UAE) තානාපති කාර්යාල ජංගම ගිණුම හා 2011 දෙසැම්බර් 31 දිනට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ සනාථ කිරීම් අතර, රු.155,130 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස දැක්වෙන රු.25,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවද, එම මුදල් අයකර ගැනීම සැකසහිත වූ බැවින් ඒ සමාන මුදලක් බොල් හා අඩමාන ණය ලෙස ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) $CTC. තේ නිෂ්පාදනය සඳහා කම්හල සංවර්ධනය කිරීමට කළුබෝව්ටියාන $Cut Tear and Curl. (CTC) තේ කම්හලට (කිසිදු පොලියක් අයකර ගැනීමෙන් තොරව) ණයක් වශයෙන් ලබා දුන් රු.22,465,416 ක මුදල වර්ෂ 15 කට වැඩි කාලයක සිට ලැබිය යුතුව තිබුණි. කෙසේ වුවද, මෙම ණය නිරවුල් කිරීමට පාර්ශවයන් දෙක අතර කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) 1995 වර්ෂයේදී පොල්හේන තේ කම්හලට සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් රු.4,329,769 ක සහනාධාරය අරමුණු කළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණු අතර, එබැවින් එම මුදල කම්හලෙන් ලැබිය යුතු ලෙස මණ්ඩලය විසින් ගිණුම්ගත කර තිබුණි. මෙම මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රජයේ මුදල් රෙගුලාසි | |
| අංක 454 | රෙගුලාසි ප්‍රකාරව කිසිදු ඉන්වෙන්ටරි ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. |
| අංක 757 (2) | 2010 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, පොත් ශේෂය සමඟ සසඳන ලද ඌනතා හා අතිරික්තතා රෙගුලාසි ප්‍රකාරව සනොක්ෂණ වාර්තාවල ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 12 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර විධිමත්ව පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.17,851,102 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු.24,502,265 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.42,353,367 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ බලපත්‍ර ගාස්තු, ලියාපදිංචි හා අළුත් කිරීමේ ගාස්තු හා අවසරපත් ගාස්තු වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.1.1 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) පෙර වර්ෂය හා සැසඳීමේදී සෙස් ආදායම රු.70,000,000 කින් අඩුවී තිබුණි.

(ආ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සංවර්ධන කටයුතු සඳහා වියදම රු.18,739,663 කින් වැඩි වී තිබුණි.

## 2.2 කාර්ය සාධනය

### 2.2.1 මණ්ඩලයේ කටයුතු

මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන්නේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ කටයුතු ක්‍රමවත් කිරීම, ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි $ලංකා තේ . අලෙවිකරණය හා ප්‍රවර්ධනය, තේ පිළිබඳ වෙළඳපොල පර්යේෂණ හා තේ කර්මාන්තය සඳහා වෙළඳපොල තොරතුරු සැපයීම හා මණ්ඩලයේ තේ කොමසාරිස් අංශය, තේ අපනයන අංශය, තේ ප්‍රවර්ධන අංශය, විශ්ලේෂණාත්මක රසායනාගාරය සහ තේ පරීක්ෂා කිරීමේ ඒකකය මගින් තේ වෙළඳාමට අවශ්‍ය රසායනාගාර හා තාක්ෂණික සේවා සැපයීමයි. භෞතික ප්‍රගතිය පිළිබඳ විස්තර විධිමත්ව පිළියෙල කර නොතිබූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා එම අංශයන්හි කාර්යයන් පිළිබඳ කාර්ය සාධනය නිශ්චය කළ නොහැක විය.

### 2.2.2 තේ කර්මාන්තයේ කාර්ය සාධනය

(අ) ශ්‍රී ලංකාවේ තේ නිෂපාදනය හා අපනයනය

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබා ගත හැකි වූ දත්ත අනුව, තේ නිෂ්පාදනය හා ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය සහ තේ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සහ තේ අපනයන ප්‍රවර්ධනය සඳහා මණ්ඩලය විසින් දරන ලද වියදම් පහත දැක්වේ.

| වර්ෂය | ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය | තේ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා තේ මණ්ඩලය විසින් දරන ලද සංවර්ධන වියදම | ශ්‍රී ලංකා තේ අපනයනය (නැවත-අපනයනය ඇතුළත්ව) | තේ අපනයනය වැඩි කිරීම සඳහා මණ්ඩලය විසින් දරන ලද ප්‍රවර්ධන වියදම | කිලෝග්‍රෑමයට නිෂ්පාදන පිරිවැය | කිලෝ ග්‍රෑමයක විකුණුම් මිල |
|---|---|---|---|---|---|---|
| | කිලෝග්‍රෑම් (මිලියන) | රු. | කිලොග්‍රෑම් (මිලියන) | රු. | රු. | රු. |
| 2007 | 304.6 | 23,725,332 | 309.9 | 92,815,993 | 210.75 | 279.52 |
| 2008 | 318.7 | 3,644,246 | 319.8 | 109,358,718 | 231.49 | 310.81 |
| 2009 | 291.1 | 24,552,506 | 289.7 | 102,286,182 | 269.01 | 360.45 |
| 2010 | 331.4 | 10,394,094 | 324.4 | 58,843,391 | 314.17 | 370.61 |
| 2011 | 328.6 | 29,133,757 | 322.6 | 25,755,657 | 350.00 (ඇස්තමේන්තු කරන ලද) | 359.89 |

මෙ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී තේ සංවර්ධන වියදම රු. මිලියන 18.74 කින් වැඩි වී තිබුණද, ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 2.8 කින් අඩු වී තිබුණි.

(ii) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී තේ අපනයනයද කිලෝග්‍රෑම් මිලියන 1.8 කින් අඩු වී තිබුණි.

(iii) පෙර වර්ෂවල තේ ප්‍රවර්ධන කාර්යයන් පැවැත්වීමෙන් පසු පෝලන්තය, ජර්මනිය, කැනඩාව හා බැංකොක් යන රටවල තානාපති කාර්යාල ගිණුම්වල රඳවා තිබුණු ශේෂයන් රු.588,679 ක් විය. මෙම අරමුදල් උපයෝජනය කිරීමෙන් කිසියම් ප්‍රවර්ධන කාර්යයක් වර්ෂය තුළදී සිදු කිරීමට හෝ අදාල තානාපති කාර්යාලවලින් ශේෂයන් ආපසු ගෙන්වා ගැනීමට හෝ මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම

මණ්ඩලය විසින් භාරගෙන තිබූ විදේශ වෙළඳ ප්‍රවර්ධන කටයුතු හා ප්‍රධාන තේ ආනයන රටවල්වල පවත්වන ලද ජාත්‍යන්තර ආහාර හා පානවර්ග වෙළඳ ප්‍රදර්ශනවලදී $පියෝ සිලෝන් ටී බ්‍රෑන්ඩ්ස්. ප්‍රවර්ධනය සම්බන්ධයෙන් 2008 සිට එක් එක් වර්ෂය තුළ සපයන ලද අනුග්‍රාහකත්වයන් පහත දැක්වේ.

| | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|
| මණ්ඩලය විසින් පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | 15 | 18 | 25 | 35 |
| සහභාගී ව සමාගම් සංඛ්‍යාව | 94 | 101 | 81 | 89 |

(ඇ) ලියාපදිංචි කටයුතු

2008 වර්ෂය සිට එක් එක් වර්ෂය අවසානයේ පහත සඳහන් තේ නිෂ්පාදකයින් හා වෙළඳුන් ලියාපදිංචි කිරීම, සහතික කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම පහත දැක්වේ.

| ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|
| තේ දළු වෙළඳුන් | 1914 | 1866 | 1703 | 1976 |
| ක්‍රියාත්මක තේ කම්හල් | 695 | 712 | 697 | 669 |
| තේ අපනයනකරුවන් | 217 | 347 | 325 | 295 |
| තේ පැකට්කරුවන් | 392 | 375 | 351 | 231 |
| ආනයනකරුවන් | 164 | 57 | 51 | 171 |
| තේ ගබඩා | 406 | 359 | 229 | 295 |
| වෙළඳ නාමයන් (සිංහ ලාංඡනය) | 451 | 96 | 94 | 83 |

(වාර්ෂික වාර්තා 2008 - 2011)

(ඇ) තේ පරීක්ෂා කිරීම් ඒකකයේ කටයුතු

තේ පරීක්ෂා කිරීම් ඒකකය විසින් තේ අලෙවි කිරීම පිළිබඳ ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය / අයිඑස්ඕ 3720 තාක්ෂණය පවත්වා ගැනීම සහ පාරිභෝගික ඇසුරුම් සඳහා වෙළඳ නාම නිෂ්පාදනයන්ට සිංහ ලාංඡන සහතිකය (Lion Logo Certificate) නිකුත් කිරීම සඳහා එක් එක් වර්ෂය තුළදී සිදු කරන ලද තේ සාම්පල් පරීක්ෂා කිරීම් පහත දැක්වේ.

| | 2011 | 2010 | 2009 |
|---|---|---|---|
| තත්ත්ව පාලනය සඳහා තේ පරීක්ෂා කිරීම් | | | |
| – වෙන්දේසියට පෙර | 151,767 | 164,336 | 130,007 |
| – නැව්ගත කිරීමට පෙර | 4,981 | 6,183 | 6,620 |
| – ආනයනය කිරීමට පෙර | 4,615 | 6,404 | 5,552 |
| – ආනයනයට පසු | 3,068 | 2,761 | 2,597 |
| පෞද්ගලික විකුණුම් නාමාවලි තක්සේරු සහතිකය වලංගු කිරීම | 5,255 | 5,025 | 11,523 |
| සෘජු විකුණුම් වලංගු කිරීම | 1,550 | 1,470 | 1,349 |

(ඉ) විශ්ලේෂණාත්මක රසායනාගාර සේවා

අභ්‍යන්තරිකව තේ කොමසාරිස් අංශයෙන් හා බාහිරව තේ අපනයනකරුවන්, ආනයනකරුවන් හා නිෂ්පාදකයන්ගෙන් ලැබෙන සාම්පල සඳහා ගුණාත්මක තත්ත්ව ප්‍රමිති සහතික නිකුත් කිරීම මගින් තත්ත්ව ප්‍රමිති කළමනාකරණය වැඩි දියුණු කිරීමේ අරමුණද සමග පවත්වාගෙන යන විශ්ලේෂණාත්මක රසායනාගාර සේවය විසින් එක් එක් වර්ෂයේ තේ සාම්පල පරීක්ෂා කිරීම් හා උපයන ලද ආදායම පහත පරිදි වේ.

| වර්ෂය | පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව | ආදායම |
|---|---|---|
| | | රු. |
| 2011 | 7,933 | 6,071,200 |
| 2010 | 7,025 | 4,171,600 |
| 2009 | 7,679 | 3,787,900 |
| 2008 | 8,741 | 867,375 |

(2008 -2010 වාර්ෂික වාර්තා හා 2011 කෙටුම්පත් වාර්ෂික වාර්තාව)

මෙ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සාම්පල පරීක්ෂා කිරීමේදී රසායනාගාරයේ සේවක ඌනතාවයට පිළියමක් ලෙස 2011 ඔක්තෝබර් සිට තේ පර්යේෂණ ආයතනයෙන් උපදෙස් හා සේවක සහායන් රසායනාගාරයේ ශුද්ධ ආදායමින් 50% ක් ගෙවීමේ පදනම මත ලබාගෙන තිබුණි.

(ii) අවස්ථා 04 කදී රසායනාගාරය විසින් ප්‍රතික්ෂේප කරන ලද අවම ගුණාත්මක තත්ත්ව ප්‍රමිතියට වඩා අඩු වූ අපනයන තේ සඳහා අනුමැතීන් ලබා දී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එම ප්‍රමාණය හා මුළු තොගයේ වටිනාකම පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 41,131 ක් හා රු.15,410,285 ක් විය.

(iii) අපනයනකරුවකු විසින් අපනයනය සඳහා සකස් කරන ලද රු.3,238,302 ක් වූ තේ තොගයක් මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වූ හෙයින් 2011 අගෝස්තු 09 දින රසායනාගාරය විසින් ප්‍රතික්ෂේප කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, මණ්ඩලය විසින් මෙම තොගය 2012 සැප්තැම්බර් 30 විගණන දිනය දක්වා නුසුදුසු බවට පත් කර නොතිබුණි.

(iv) මණ්ඩලය විසින් 2010 වර්ෂය තුළදී රු.55,526,585 කට $Pesticide Residue Analysis. උපකරණය මිලදී ගෙන තිබුණද, 2012 සැප්තැම්බර් 30 විගණන දිනය දක්වා මණ්ඩලය විසින් එවැනි විශ්ලේෂණයක් කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, එම උපකරණය තවමත් පරීක්ෂා කිරීම් තත්ත්වයේ පැවතුණි.

## 2.3 හඳුනාගන්නා ලද පාඩු

පහත දැක්වෙන ප්‍රමාණයන් පාඩු ලෙස ලාභයෙන් කපා හැර තිබුණි.

(අ) අදාල ලියකියවිලි නොමැති වීම හේතුවෙන් එකතුව රු.156,100 ක් වූ මුදලක් ලැබිය යුතු ඇප තැන්පතු ලෙස පැවතුණි.

(ආ) 1996 වර්ෂයේදී තේ ප්‍රවර්ධන නිලධාරින් සඳහා මොස්කව්හි නිවාසයක් සැපයීම වෙනවෙන් වූ රු.314,720 ක ලැබිය යුතු කුලී තැන්පතුවක් අදාළ ලියකියවිලි නොමැති වීම හේතුවෙන් ලියා හැර තිබුණි.

(ඇ) මොස්කව්හි තේ ප්‍රවර්ධන කාර්යාලය සඳහා 1993 වර්ෂයේදී ගෙවන ලද රු.359,680 ක් වූ කුලී තැන්පතුව, නියමිත දිනයේ නිවාසය හිස්කර නොදීම හේතුවෙන් අය කර ගත නොහැකි වී තිබුණි.

(ඈ) 2008 වර්ෂයේදී ජපානයේ තේ ප්‍රවර්ධන ඒකකය වසා දමන විට එහි සිට ආපසු ගෙන එන ලද වාහනය අපහරණයෙන් රු.1,210,000 ක පාඩුවක් සිදු වී තිබුණි. තවද, පෙර වර්ෂ ගිණුම්වල ප්‍රත්‍යාගණන අතිරික්තයට එරෙහිව රු.3,461,884 ක් ප්‍රත්‍යාගණන පාඩුව ලෙස හිලව් කර තිබුණි.

## 2.4 කාර්ය මණ්ඩල තත්ත්වය

මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල පිරිවැය වාර්තාවලට අනුව, 2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාර්ය මණ්ඩල තත්ත්වය පහත දැක්වේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්ත තනතුරු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 05 | - | 01 |
| ද්විතියික මට්ටම | 27 | 20 | 10 | 03 |
| තෘතියික මට්ටම | 193 | 151 | 48 | 06 |
| ප්‍රාථමික මට්ටම | 76 | 67 | 09 | - |
| එකතුව | 300 | 243 | 67 | 10 |

(i) 2011 දෙසැම්බර් 01 දිනැති අංක ඩීඑම්එස්/ඩී/2/02/62 දරන කළමනාකරණ සේවා ලිපියට අනුව, සේවක සංඛ්‍යාව 300 ක් අනුමත කර තිබූ අතර, අතිරික්ත තනතුරු 10 ක් එම අවස්ථාවේ සේවයේ යෙදී සිටි සේවකයන්ට පෞද්ගලික වනසේ අනුමත කර තිබුණි.

(ii) නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (IT) ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, නියෝජ්‍ය හා සහකාර තේ කොමසාරිස්වරු, නීති නිලධාරී, තාක්ෂණ සහකාර (රසායනාගාර) ආදී තනතුරු ඇතුළත්ව 2011 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 67 ක් විය. නව බඳවා ගැනීම් යෝජනා ක්‍රමය මගින් තේ පරීක්ෂකවරු / සහකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් 2011 නොවැම්බර් 24 දින මණ්ඩලයට එරෙහිව මණ්ඩලයේ තාක්ෂණික නිලධාරීන්ගේ සංගමය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, නඩුව 2012 ජූලි 31 දින වන විටත් තීන්දුවක් අපේක්ෂාවෙන් පැවතුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන කරනු ලැබේ.

(අ) තේ කොමසාරිස් අංශය විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ල 2002 දෙසැම්බර් 31 දින සිට හිස් වී තිබුණු අතර, පරිශ්‍රයේ අයිතිකරු වෙත තැන්පත් කරන ලද රු. මිලියන 2.4 ක කුලී අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් මණ්ඩලය විසින් අයකරගෙන නොතිබුණි. කෙසේ වුවද, මෙම කාරණය සඳහා තීරකවරයෙක් පත් කර තිබුණු බවත්, මේ සම්බන්ධයෙන් 2005 වර්ෂයේ සිට 2011 මැයි 30 දක්වා රු.මිලියන 2.8 ක මුදලක් වැය කර තිබුණු බවත්, විගණනයේදී නිරීක්ෂණය විය. වර්ෂ 04 ක් ගතවීමෙන් පසුව 2009 වර්ෂයේදී

බේරුම් කිරීමේ ක්‍රියාවලිය අවසන් වී තිබුණු අතර, තීරණයට අනුව ගොඩනැගිල්ලට සිදු වූ හානිය හා අළුත්වැඩියා හැර රු.මිලියන 1.8 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතු විය. එහෙත්, පරිශ්‍රයේ අයිතිකරු විසින් ගොඩනැගිල්ලට වූ හානි වෙනුවෙන් හා 2003 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කුලියට දීම සඳහා ගොඩනැගිලි භූමිය ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට නොහැකි වීම වෙනුවෙන් රු. මිලියන 4.9 ක වන්දි මුදලක් ඉල්ලමින් 2008 ඔක්තෝබර් මාසයේදී මණ්ඩලයට එරෙහිව වෙනත් තීරකවරයෙක් පත් කර තිබුණි. මෙම කාරණය තීන්දුවක් අපේක්ෂාවෙන් තවමත් පවතී.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් එක් අංශයේ කටයුතුවලට සහාය වීම සඳහා $Specialized Application. මෘදුකාංග හා ආශ්‍රිත දෘඩාංග සපයා සවි කිරීමට මණ්ඩලය විසින් 2009 දෙසැම්බර් 31 දක්වා පෞද්ගලික ආයතනයකට රු.9,038,930 ක මුදලක් ගෙවා තිබුණි. 2005 අප්‍රේල් 07 දින එළඹී දෙපාර්ශ්වයේ ගිවිසුම ප්‍රකාරව මෙම ජාල පද්ධතිය ගෙනැවිත් සවි කර භාර දීම සඳහා දින 90 ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණද, දෙපාර්ශ්වයේම අඩුපාඩු හේතුවෙන්, නිම කිරීමේ කාලය 2008 අප්‍රේල් 01 දින දක්වා අන්‍යොන්‍ය එකඟතාවය මත දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, 2012 ජූලි 30 වනවිටත් මෙම කාර්යය නිම කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්වල දක්වා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.6 තේ ප්‍රවර්ධනය හා අලෙවි උපාය මාර්ග සඳහා බදු

2010 ඔක්තෝබර් 27 දින ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව අපනයනය කරන ලද තේ කිලෝ ග්‍රෑම් එකකට රු.3.50 බැගින් 2010 නොවැම්බර් 01 සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ තේ ප්‍රවර්ධනය හා අලෙවි උපාය මාර්ග සඳහා තේ අපනයනකරුවන්ගෙන් රු. මිලියන 1308.09 ක මුදලක් රැස් කර ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රැස් කිරීමේ ප්‍රධාන අරමුණ තේ ප්‍රවර්ධනය හා අලෙවි උපාය මාර්ග සඳහා එම මුදල් යෙදවීම වුවද, කෙටි කාලීන ආයෝජනවල එම මුදල් ආයෝජනය කර පොලය ලෙස රු.මිලියන 66.44 ක මුදලක් උපයා තිබුණි.

(ආ) විධිමත් සැලැස්මක් හා කළමනාකරණයක් නොවීම හේතුවෙන් එම රැස් කරගත් මුදල්වලින් රු. මිලියන 25.75 ක් එනම්, 1.87% ක් පමණක් 2011 වර්ෂය දක්වා ප්‍රවර්ධනය හා අලෙවි කටයුතු සඳහා යොදාගෙන තිබුණි.

(ඇ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රවර්ධන හා අලෙවි කටයුතු රු. මිලියන 33.08 කින් එනම්, 56.23% කින් අඩු වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රවර්ධන හා අලෙවි කටයුතු සඳහා රු. මිලියන 1,150 ක අයවැය ප්‍රතිපාදනයක් සලසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 25.75 ක් එනම්, 2.2% ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඉ) ගැසට් නිවේදනයේ 04 ඡේදය අනුව, රැස් කර ගත් මුදල මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදලේ කොටසක් ලෙස තීරණය කළ යුතුය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු. මිලියන 1,348.78 ක් වූ ඉතිරි බදු මුදල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඊ) 2010 දෙසැම්බර් 15 සිට 2011 දෙසැම්බර් 14 දක්වා වර්ෂයක කාලයක් සඳහා රටවල් 80 ක ස්ථාපනය කරන ලද $පාස්පෝට් හොට් ඩ්‍රින්ක්ස් (තේ). යටතේ අලෙවිකරණ නොරතුරු ආවරණය කිරීමේ අංශයේ $යූරෝ මොනිටර් ඉන්ටර්නැෂනල් පැකේජය. මිලදී ගැනීමට බදු මුදලින් රු.2,132,243 ක මුදලක් (එ.ජ.ඩො. 19,000) ගෙවා තිබුණි. කෙසේ වුවද, බදු අරමුදලින් ඉහත ගෙවීම කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් නිශ්චිත අනුමැතියක් ලබා ගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) දිවයින තුළ හා පිටත ගනුදෙනුකරුවන් අතර බෙදා හැරීම සඳහා ප්‍රවර්ධන හා අලෙවිකරණ කාර්යයක් ලෙස පෝස්ටරයක් මුද්‍රණය කිරීමට සමාලෝචිත වර්ෂය තුළ පෞද්ගලික සමාගමකට රු.86,238 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, පෝස්ටරයේ පෙනුම තේ අලෙවිකරණයට අදාල වන විධිමත් තත්ත්වයක නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3. අයවැය ලේඛනමය පාලනය

අයවැය සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ නිරීක්ෂණයන් මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ඉන්වෙන්ටරි
(ආ) ගිණුම්කරණය
(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ
(ඈ) ප්‍රවර්ධන කටයුතු